සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය I - II	කාලය நேரம் Time: පැය 03යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I පත්‍රය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.	අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. දත්ත සහ තොරතුරු සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
   A - වෙන් වෙන්ව ගත් කළ අර්ථයක් දීමට නොහැකි අකුරු ඉලක්කම් සංකේත ආදිය දත්ත වේ
   B - දත්ත ක්‍රමානුකූලව සකස් කිරීමෙන් තොරතුරු ලබා ගත හැකිය
   C - අංග සම්පූර්ණ බව ගුණාත්මක තොරතුරක ලක්ෂණයක් වේ
   D - තීරණ ගැනීම සඳහා තොරතුරු භාවිතා කරයි
   ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක් ද?
   (1) A, B සහ D පමණි (2) A සහ B පමණි (3) D පමණි (4) A, B, C සහ D යන සියල්ල ම

2. පරිගණක පරම්පරා පිළිබඳ පහත කවරක් සත්‍ය වේ ද?
   (1) දෙවන පරම්පරාවේ පරිගණක වල අනුකලිත පරිපථ භාවිතා කරන ලදී
   (2) පළමුවන පරම්පරාවේ පරිගණක වල ට්‍රාන්සිස්ටර භාවිතා කරන ලදී
   (3) තුන්වන පරම්පරාවේ පරිගණක වල කෘත්‍රිම බුද්ධිය භාවිතා කරන ලදී
   (4) හතරවන පරම්පරාවේ පරිගණක වල ක්ෂුද්‍ර සකසනය භාවිතා කරයි

3. ඉලෙක්ට්‍රොනික වෙළෙඳාම යනු අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ මිලදී ගැනීම වේ. මෙහි වාසි මෙන්ම අවාසි ද දැකිය හැකිය.
   A - දේශීය මෙන්ම විදේශීය භාණ්ඩ මිලදී ගැනීමට හැකි වීම
   B - 24 පැයෙහි සේවාව
   C - පහසු ස්ථානයක සිට භාණ්ඩ නිරීක්ෂණය කර ඇණවුම් කිරීමේ හැකියාව
   D - හර කාඩ්පත් හරහා ගෙවීම් කිරීමේ දී ගැටලු මතු වීම
   ඉලෙක්ට්‍රොනික වෙළෙඳාමේ වාසි පමණක් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
   (1) A, B සහ C පමණි (2) A සහ C පමණි (3) D පමණි (4) A, B, C සහ D යන සියල්ල ම

4. ලොව පළමු වන යාන්ත්‍රික ගණිතකර්ම උපකරණය ලෙස හඳුන්වනු ලබන්නේ පහත ඒවා අතරින් කුමක් ද?
   (1) ආකලන යන්ත්‍රය (2) සිදුරු කාඩ්පත් (3) ඇනලිටිකල් එන්ජිම (4) ඇබකසය

5. ලක්ෂීය ආදාන උපාංගයක්, චුම්බක තාක්ෂණය සහිත ආචයන උපාංගයක්, දෘඪ පිටපතක් ප්‍රතිදානය කරන ප්‍රතිදාන උපාංගයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
   (1) මූසිකය, සංයුක්ත තැටිය, මුද්‍රණ යන්ත්‍රය (2) මූසිකය, දෘඪ තැටිය, ලකුණුකරණය
   (3) යතුරු පුවරුව, චුම්බක පටිය, මුද්‍රණ යන්ත්‍රය (4) යතුරු පුවරුව, නම්‍ය තැටිය, ලකුණුකරණය

Past Papers Wiki

6. පරිගණකය භෞතික ප්‍රමාණය අනුව සහ භාවිතා කරන තාක්ෂණය අනුව වර්ගීකරණය කළ හැකිය. එම වර්ගීකරණයන් පිළිවෙලින් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
   (1) විශේෂ කාර්ය, සාමාන්‍ය කාර්ය සහ අංකිත, ප්‍රතිසම, මිශ්‍ර ලෙස
   (2) අංකිත, ප්‍රතිසම, මිශ්‍ර සහ සුපිරි, මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, ක්ෂුද්‍ර ලෙස
   (3) සුපිරි, මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, ක්ෂුද්‍ර සහ අංකිත, ප්‍රතිසම, මිශ්‍ර ලෙස
   (4) මහා පරිමාණ, මිශ්‍ර පරිගණක සහ සුපිරි පරිගණක ලෙස

7. දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
   A - භෞතික මාධ්‍ය යොදා ගැනීමක් සිදු නොවේ
   B - වයිෆයි සහ බ්ලූටූත් සඳහා යොදා ගනී
   C - සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන එකිනෙකට දර්ශනය වන ලෙස පිහිටා ඇත
   D - දත්ත ගමන් කරන්නේ රේඛීය ආකාරයෙන් වේ
   ඉහත ලක්ෂණ හා සැසඳෙන පිළිතුර වන්නේ කුමක් ද?
   (1) A සහ B ක්ෂුද්‍ර තරංගවලට අදාළ වන අතර C සහ D ගුවන් විදුලි දත්ත සම්ප්‍රේෂණයට අදාළ වේ
   (2) A සහ B ගුවන් විදුලි දත්ත සම්ප්‍රේෂණය වන අතර C සහ D ක්ෂුද්‍ර තරංගවලට අදාළ වේ
   (3) A සහ B නියමු සම්ප්‍රේෂණ ආකාර වන අතර C සහ D නියමු නොවන සම්ප්‍රේෂණ ආකාර වේ
   (4) A සහ B ගුවන් විදුලි දත්ත සම්ප්‍රේෂණය වන අතර C සහ D ප්‍රකාශ තන්තු කේබලය වේ

8. පරිගණක ජාලයක් හෝ නිවසේ ඇති පරිගණකයක් අන්තර්ජාලයට සම්බන්ධ කිරීමට භාවිතා කරන උපාංගය වන්නේ කුමක් ද?
   (1) ස්විචය (2) මං හසුරුව (3) නාභිය (4) ගිණි පවුර

9. දශමය 156 ට තුල්‍ය ෂඩ් දශමය සංඛ්‍යාව කුමක් ද?
   (1) 912_{16} (2) $9C_{16}$ (3) 913_{16} (4) $9B_{16}$

10. අෂ්ටමය 340 ට තුල්‍ය ද්විමය සංඛ්‍යාව කුමක් ද?
   (1) 11100000_2 (2) 1110000_2 (3) 110100000_2 (4) 1010011_2


11. ද්විමය 10010101 ට තුල්‍ය දශමය අගය කුමක් ද?
   (1) 105 (2) 140 (3) 139 (4) 149

12. 1GB තුළ ඇති කිලෝ බයිට් (KB) ගණන කොපමණ ද?
   (1) 1024X1024 KB (2) 1024X1024X1024 KB (3) 1024X1024X1024 X1024 KB (4) 1024 KB

13. a හි ASCII කේතයේ දශමය අගය 97 නම් f හි ASCII කේතය කුමක් ද?
   (1) 1100001 (2) 1100111 (3) 1100110 (4) 1100101


14. 0111010 යන ද්විමය සංඛ්‍යාවේ අඩුම වෙසෙසි බිටුව සහ වැඩිම වෙසෙසි බිටුව නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
   (1) 0 සහ 0 (2) 1 සහ 1 (3) 0 සහ 1 (4) 1 සහ 0

15. පහත දැක්වෙන තාර්කික පරිපථයේ A, B පිළිවෙලින් 0, 1 නම් C හා D හි අගයන් වනුයේ මොනවා ද?



   (1) 1, 1
   (2) 1, 0
   (3) 0, 1
   (4) 0, 0





16. පහත දැක්වෙන තාර්කික පරිපථයේ P=1 නම් R හි ප්‍රතිදානය කුමක් ද?



   (1) 0
   (2) 1
   (3) P
   (4) Q

17. ජාතික නව නිපයුම් තරගයේ එක් වටයක සිට ඊළඟ වටයට තේරී පත්වීම සඳහා විනිශ්චයකරුවන්ගේ මණ්ඩල දෙකෙන් ම ප්‍රශස්ථ ලකුණ ඉක්මවා යාම අනිවාර්ය වේ. ඉහත සිද්ධියට අදාළ බූලීය සම්බන්ධතාව වනුයේ පහත කුමක් ද?
   (1) OR (2) AND (3) NOT (4) NAND

18. AND තාර්කික ද්වාරයට අදාළ පරිපථ සංකේතය කුමක් ද?

(1)  (2)  (3)  (4) 

19. පහත දැක්වෙන ආචයන උපාංග ප්‍රවේශ වේගය අනුව නිවැරදි ආරෝහණ අනුපිළිවෙල කුමක් ද?
(1) වාරක මතකය, මතක රෙජිස්තර, RAM, CD, දෘඪ තැටිය
(2) වාරක මතකය, මතක රෙජිස්තර, RAM, දෘඪ තැටිය, CD
(3) දෘඪ තැටිය, CD, මතක රෙජිස්තර, RAM, වාරක මතකය
(4) CD, දෘඪ තැටිය, RAM, වාරක මතකය, මතක රෙජිස්තර

20. උපයෝගීතා මෘදුකාංග සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතරින් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) මේවා පරිගණකයේ සම්පත් කළමණාකරණය කිරීමට සහාය දක්වයි
(2) සාමාන්‍යයෙන් පරිගණකයක් නඩත්තු කරගෙන යාමේ දී සහාය වේ
(3) පරිගණකය සහ පරිශීලකයා අතර සම්බන්ධතාවය ගොඩ නගා දීමට සහාය වේ
(4) බොහෝ විට පරිගණකයට බලපෑම් කරන විවිධ උපද්‍රවවලින් ආරක්ෂා කර ගැනීමට සහාය වේ

21. සේවාදායක (Server) පරිගණකයකට ස්ථාපනය කළ හැකි වඩාත් සුදුසු මෙහෙයුම් පද්ධතියක් වනුයේ කුමක් ද?
(1) Windows 10 (2) Linux (3) MacOS (4) Ubuntu

22. පරිගණක මෙහෙයුම් පද්ධතියකින් ඉටුකෙරෙන කාර්යයක් ලෙස දැක්විය **නොහැක්කේ** පහත පිළිතුරු අතරින් කුමක් ද?
(1) පරිගණකය තුල සිදුවන ඕනෑම වැඩසටහනක් හෝ ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය කරන ආකාරයේ මධ්‍ය සැකසුම් ඒකකයේ කාලය වෙන් කර ගැනීම
(2) පරිගණකයකට අනිෂ්ට මෘදුකාංග වලින් ඇතිවන බලපෑම හේතුවෙන් මෘදු ක්‍රියාකාරීත්වයට වන බලපෑම් වලින් පරිගණකය ආරක්ෂා කර ගැනීම
(3) පරිශීලකයාට අන්තර්ජාලයට පිවිසීම වැනි ඔහුගේ විවිධ පරිගණක අවශ්‍යතා ඉටු කර ගැනීමට සහාය දැක්වීම
(4) ක්‍රියාත්මක වන ක්‍රියාවලින් සඳහා අවශ්‍ය මතකය වෙන්කර දීම හා ක්‍රියාවලිය අවසානයේ එම මතකය නිදහස් කර දීම

23. පහත පරිගණක ආශ්‍රිත කාර්යයන් අතරින් මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීමට පෙර කරන කාර්යය ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) පරිගණකයේ පරිශීලක අතුරු මුහුණත සකස් කර ගැනීම
(2) ප්‍රවේශ පාලනයට වෙන් වෙන්ව පරිශීලක ගිණුම් සකස් කර ගැනීම
(3) දෘඪ තැටිය කොටස්වලට වෙන් කිරීම සහ ආකෘතිකරණය කිරීම
(4) ප්‍රතිභාගීකරණය කර දෘඪ තැටිය සංවිධානය කිරීම

24. වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් සකස් කළ ලේඛනයක් මුද්‍රණය කිරීමේ විධානය ලබා දුන් පසු විවෘත වන සංවාද කොටුව මගින් ලැබෙන පහසුකමක් **නොවන්නේ** කුමක් ද?
(1) මුද්‍රකය තෝරා ගැනීම
(2) මුද්‍රණ පිටපත් (Copies) ප්‍රමාණය තෝරා ගැනීම
(3) මුද්‍රණය කළ යුතු පිටුව හෝ පිටු තේරීම
(4) මුද්‍රණයෙන් පසු නැවත save වන ස්ථානය බලා ගැනීම

25. වදන් සැකසුම් මෘදුකාංගවල බහුලව භාවිත වන ශබ්ද නිධිය (Thesaurus) පහසුකමෙහි ප්‍රයෝජනය වඩා හොඳින් කියවෙන පිළිතුර කුමක් ද?
(1) ලේඛනගත වචන සොයා ඒ වෙනුවට වෙනත් වචන ප්‍රතිස්ථාපනය
(2) වචනයක් වෙනුවට එම අදහස දෙන වෙනත් වචන සෙවීම හා ඒවා ප්‍රතිස්ථාපනය
(3) අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ දෝෂ සෙවීම
(4) වචනවලට විරුද්ධාර්ථ පද සෙවීම හා ප්‍රතිස්ථාපනය

26. පහත සඳහන් මෘදුකාංග අතරින් වදන් සැකසුම් මෘදුකාංග පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(1) MS word, Abi word, Google docs, Apple pages
(2) MS word, Abi word, Google docs, Apple Keynote
(3) MS docs, Abi word, Google writer, Apple pages
(4) MS word, Libre office writer, Google docs, Apple Keynote

27. වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් සකස් කරන වගුවක් සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ සලකන්න.

A - වගුවක තීරු සහ පේළි සංයුක්ත කළ හැකි අතර වගුවක කෝෂයක් කෝෂ කිහිපයක් බවට පත් කළ හැකිය

B - වගුවක පසුබිමට වර්ණ එක් කළ හැකි අතර පසුබිමට පින්තූර එක් කළ නොහැකිය

C - වගුවක පාඨ අන්තර්ගතයක දිශානතිය වෙනස් කළ හැකිය

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ පමණක් අඩංගු පිළිතුර වනුයේ කුමක් ද?

(1) A පමණි (2) A සහ C පමණි (3) B සහ C පමණි (4) A, B සහ C යන සියල්ල ම

28. වදන් සැකසුම් මෘදුකාංගයක ඇති ඉක්මන් ප්‍රවේශ මෙවලම් තීරුව සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?

(1) සුරැකීම, විවෘත කිරීම, ලොප් කිරීම වැනි ඉතා ඉක්මනින් ඉටුකරගත යුතු විධාන වලින් සමන්විත වේ

(2) Save, undo සහ redo යන විධාන වෙනස් කළ නොහැකි අතර වෙනත් විධාන පරිශීලක අවශ්‍යතාවය මත යෙදිය හැකිය

(3) මෙය සාමාන්‍යයෙන් වදන් සැකසුම් ලේඛනයක තත්ත්ව තීරුව තුළ පිහිටයි

(4) මෙය වදන් සැකසුම් මෘදුකාංගවල පමණක් දැකිය හැකිය

29. ගුණාත්මක විද්‍යුත් සමර්පණයක් සම්බන්ධයෙන් පහත සඳහන් පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) වර්ණ යෙදීමේ දී කරුණු උද්දීපනය කිරීම පිණිස රතුපාට වර්ණය බහුලව යොදා ගැනීම සාමාන්‍ය දෙයකි

(2) එක් කදාවකට වීඩියෝ එකක් පමණක් භාවිතයෙන් ශබ්ද මිශ්‍රවීම මගින් ඇතිවන ගැටළු අවම කරගත හැකිය

(3) සමර්පණයක දී හඬ පටිගත කළ නොහැකි නිසා වීඩියෝ පමණක් එක් කිරීම දැකිය හැකිය

(4) හැකිතාක් කරුණු එක් කිරීම මගින් සමර්පණයේ භාවිත කරන කදා ප්‍රමාණය අඩුකර ගැනීම සිදු කළ හැකිය

30. විද්‍යුත් සමර්පණ මෘදුකාංග සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතරින් **සාවද්‍ය** ප්‍රකාශය සහිත පිළිතුර කුමක් ද?

(1) Apple keynote සහ Google slide යනු වාණිජ මෘදුකාංග වේ

(2) Libre office Impress හා Open office Impress යනු නිදහස් සමර්පණ මෘදුකාංග වේ

(3) නොමිලේ භාවිත කළ හැකි Canva මෘදුකාංගය මගින් සමර්පණ නිර්මාණය කළ හැකිය

(4) Prezi සහ WPS presentation යන මෘදුකාංග මගින් ද සමර්පණ නිර්මාණය කළ හැකිය

31. විද්‍යුත් සමර්පණ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - සමර්පණයක එක් එක් කදා සඳහා නිර්මාණකරුගේ අවශ්‍යතාවය පරිදි සටහන් යෙදිය හැකිය

B - කියවුම් දසුනේ දී එක් එක් කදාවේ අන්තර්ගත හොඳින් කියවා බලා ගැනීමට හැකිය

C - විද්‍යුත් සමර්පණයක ඇති කදා පරිශීලක අවශ්‍යතාවය මත මුද්‍රණය කරගත හැකිය

ඉහත ප්‍රකාශ සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර පහත ඒවා අතරින් කුමක් වේද?

(1) A සහ B වේ (2) A සහ C වේ (3) B සහ C වේ (4) A, B සහ C යන සියල්ල ම

32. ඉ සමර්පණයක් සම්බන්ධයෙන් සපයා ඇති පහත සඳහන් පිළිතුරු අතරින් **සාවද්‍ය** වන්නේ කුමන ප්‍රකාශය ද?

(1) සමර්පණයේ එක් දෘශ්‍ය රාමුවක සිට තවත් දෘශ්‍ය රාමුවකට මාරු වීම සකස් කිරීමට කදා සංක්‍රමණය යොදා ගනියි

(2) සමර්පණයක කදාවල අඩංගු පින්තූර, වගු සහ ප්‍රස්තාර සඳහා පමණක් සජීවීකරණ යොදා ගනියි

(3) සමර්පණයක කදාවන්ට රූප, වගු, රාමු මෙන්ම ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පසුරු ද ඇතුළු කළ හැකිය

(4) සමර්පණය නිර්මාණය කරන අතරතුර F5 යතුර භාවිතයෙන් මුල සිට නැරඹීම සිදුකළ හැකිය

33. පහත සඳහන් කෝෂ යොමු අතරින් පේළි නිරපේක්ෂ කෝෂ යොමුවක් වන්නේ කුමක් ද?

(1) B$8 (2) B8 (3) $B8 (4) B8$

Past Papers Wiki

ප්‍රශ්න අංක **34** සහ **35** ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත දැක්වෙන පැතුරුම්පත් කොටස උපයෝගී කරගන්න.

	A	B	C	D	E	F
1	25	20	12	20	77	
2	45	12	2	20	79	
3	45	12	32	20	109	
4	5.7					

34. E1 කෝෂයට A1 සිට D1 දක්වා අගයන්ගේ එකතුව ලබා ගැනීමට භාවිතා කළ හැකි සූත්‍රය වන්නේ කුමක් ද?

(1) =SUM(A1, A2, A3, A4)
(2) =SUM(A1:D1)
(3) =SUM(A!:C1, D1)
(4) =SUM(A1:B1, D1)

35. A4 සඳහන් අගය E1 සිට E3 දක්වා කෝෂ පරාසයේ ඇති අගයෙන් ගුණකර F1 සිට F3 දක්වා පරාසයට ලබා ගැනීමට F1 හි ලිවිය යුතු සූත්‍රය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) =$A4*E1
(2) =A$4*E1
(3) =A4*E1
(4) =A4*$E4

36. පැතුරුම්පතක කෝෂයකට =6*2/2^2+(4/2) සූත්‍රය ඇතුළත් කළ විට ලැබෙන අගය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) 38 (2) 5 (3) 15 (4) 32

37. රූපයේ දැක්වෙන පැතුරුම්පතේ A7 කෝෂයට =COUNT(A1:A6) ලෙස ඇතුලත් කළ විට දිස්වන පිළිතුර වන්නේ කුමක් ද?

	A	B
1	10/23/2005	
2	5%	
3	45.5	
4		
5	AB	
6	50	
7		

(1) 6
(2) 3
(3) 4
(4) 7

පහත ප්‍රශ්න අංක **38** සිට **40** තෙක් පිළිතුරු සැපයීමට රක්ෂණ සමාගමක් විසින් රක්ෂණාවරණ, සාමාජිකයින් සහ ගෙවීම් පිළිබඳව පහත දක්වා ඇති දත්ත සමුදාය වගු භාවිතා කරන්න.

සාමාජික (Members Table)

M_ID	M_Name	Gender	DOB
M001	H.Perera	Male	1977/04/25
M002	R.Fernando	Male	1985/10/24
M003	W.jayathilaka	Female	1990/12/10

රක්ෂණාවරණ (Insurance Table)

I_ID	I_Name	Durarion	installments
I001	Life Insurance	20 Years	Yes
I002	Hospital coverage	12 Months	No
I003	Family Insurance	10 Years	Yes

PAST PAPERS WIKI

Past Papers Wiki

රක්ෂණාවරණ ප්‍රතිලාභ (Insurance Benefits Table)

I_ID	M_ID	Insurance
I003	M001	Yes
I004	M001	No
I005	M002	Yes

38. සාමාජික වගුවේ ක්ෂේත්‍ර ගණන සහ රෙකෝඩ ගණන පිළිවෙලින් වනුයේ,
(1) 4, 3 (2) 3, 4 (3) 4, 5 (4) 5, 4

39. රක්ෂණාවරණ වගුවේ ප්‍රාථමික යතුර වනුයේ කුමක් ද?
(1) I_ID (2) I_Name (3) Duration (4) Installments

40. H.Perera මහතා ගෙවීම් සිදු කරනු ලබන රක්ෂනාවරණයේ නම සොයා ගැනීම සඳහා සම්බන්ධ කළ යුතු වගුව / වගු මොනවාද?
(1) සාමාජික (2) රක්ෂණාවරණ
(3) රක්ෂණාවරණ ප්‍රතිලාභ (4) සාමාජික, රක්ෂණාවරණ, රක්ෂණාවරණ ප්‍රතිලාභ

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය I -II	කාලය நேரம் Time

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

II පත්‍රය

- **පළමුවන** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් **ප්‍රශ්න හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.

1. (i) පරිගණක කෙවෙනි කිහිපයක් පහත දක්වා ඇති වගුවේ X තීරුවේ A සිට D දක්වා වන අක්ෂර මගින් දක්වා ඇත. එම කෙවෙනිවලට සම්බන්ධ කළ හැකි උපාංග කිහිපයක් Y තීරුවේ 1 සිට 4 දක්වා අනුපිළිවෙලට නොමැතිව ලබා දී ඇත.

X				
	A	B	C	D
Y	1	2	3	4
	ජාලකරණ ස්විචය	යතුරු පුවරුව	තිත් න්‍යාස මුද්‍රකය	සංදර්ශකය

X සහ Y තීරු ගළපා යුගල ලේඛල මගින් ලියා දක්වන්න.

(ii) දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය හා සම්බන්ධ පහත ප්‍රකාශවල සත්‍ය / අසත්‍යතාවය ලියා දක්වන්න.

A - ගුවන් විදුලි තරංග භාවිතා කරන වයිෆයි සහ බ්ලූටූත් නියමු නොවන සම්ප්‍රේෂණ මාධ්‍යයකි.

B - සැටලයිට් හරහා දත්ත සම්ප්‍රේෂණයේ දී ක්ෂුද්‍ර තරංග භාවිතා කරයි.

C - රූපවාහිනී ඇන්ටෙනා කේබල සහ පියැවූ පරිපථ කැමරාවල නොවැසුණු ඇඹරූ කම්බි යුගල කේබල භාවිතා කරයි.

D - කේබල රහිත යතුරු පුවරු සහ මූසිකවල අධෝරක්ත තරංග භාවිතා කරයි.

(iii) $6DA_{16}$ යන ෂඩ්දශමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටමය සංඛ්‍යාව ලබා ගන්න. (ගණනය කිරීම් පෙන්වන්න.)

(iv) A හි ASCII කේතය 1000001 නම් NO යන්නෙහි ASCII කේතය ලබා ගන්න.

(v) පහත දැක්වෙන සත්‍යතා වගුවේ A, B, C සහ D සඳහා සුදුසු අගයන් මොනවා ද?

x	y	$\overline{(\bar{x}.\bar{y})}$
0	0	A
0	1	B
1	0	C
1	1	D

(vi) වදන් සැකසුම් මෘදුකාංගයක් තුළ භාවිතා කරන කෙටි මං යතුරු කිහිපයක් X තීරුවේ A සිට D දක්වා ඇත. ඒවායේ කාර්යයන් අනුපිළිවෙලට නොමැතිව Y තීරුවේ 1 සිට 4 දක්වා ලබා දී ඇත.

X		Y	
A	Ctrl+A	1	නව ලේඛනයක් ලබා ගැනීම
B	Ctrl+Home	2	ලේඛනයක් හෝ පාඨ කොටසක් පිටපත් කිරීම
C	Ctrl+N	3	ලේඛනයේ මුලට ගමන් කිරීම
D	Ctrl+C	4	මුළු ලේඛනය ම තෝරා ගැනීම


Past Papers Wiki

(vii) වදන් සැකසුම් මෘදුකාංගයක දක්නට ලැබෙන පහත A සහ B යන මෙවලම් වල භාවිතය ලියා දක්වන්න.

A → 


B → 

(viii) පහත රූපය මගින් දැක්වෙන විද්‍යුත් පැතුරුම්පත් කොටස හොඳින් නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට ලේඛල භාවිතයෙන් පිළිතුරු ලියා දක්වන්න. උදා : 1 – E



(1) තීරුවක් දිගේ සකස් වූ කෝෂ පරාසයකි.
(2) පේළියක් දිගේ සකස් වූ කෝෂ පරාසයකි.
(3) තීරුවක් සහ පේළියක් දිගේ සකස් වූ කෝෂ පරාසයකි.
(4) සක්‍රීය කෝෂය වේ.

(ix) පහත දැක්වෙන්නේ විද්‍යුත් සමර්පණ නිර්මාණයේ දී භාවිත වන කදා පිරි සැලසුම් වලින් කිහිපයකි. පහත දී ඇති කාර්යයන් සඳහා වඩාත් සුදුසු කදා පිරි සැලසුමට අදාළ අංකය ලියන්න.



A - වීඩියෝ ගොනුවක් එක් කිරීමට
B - මාතෘකාවක් සමග අන්තර්ගතයක් තීරු දෙකකට එක් කිරීමට
C - සංසන්දනාත්මක අන්තර්ගතයකට
D - මාතෘකාවක් පමණක් යෙදීමට

(x) පහත දැක්වෙන දත්ත සමුදාය සලකන්න.

Doc_code	Description	Date	Tel_no
D001	Monthly income	2025/10/11	0711111111
D002	Loan	2025/10/11	0772222222
D003	Personal files	2025/10/21	0783333333

ඉහත දත්ත සමුදායේ ඒ ඒ ක්ෂේත්‍රයන් සඳහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූප මොනවා ද?

2. (i) පහත දක්වා ඇති ලැයිස්තුවෙන් තෝරා 1 සිට 4 දක්වා ප්‍රකාශවල ඇති හිස්තැන් සඳහා වඩාත් සුදුසු යෙදුම තෝරා ලියන්න.

1. පරිශීලකයා තිරය මත දකින ප්‍රථම චිත්‍රක හෝ වදන් ප්‍රතිදානය සහ පරිගණකයේ මූලික ක්‍රියාත්මක වීමට අදාළ උපදෙස් හඳුන්වන්නේ ..... ලෙස ය.
2. පරිගණකයේ දෘඩාංග මෙන්ම වෙනත් මෘදුකාංග කළමනාකරණය ..... මගින් සිදු වේ.
3. නිශ්චිත හැඩයක් සහිත ස්පර්ශ කළ හැකි පරිගණක භෞතික කොටස් ..... ලෙස හඳුන්වයි.
4. පරිගණකය භාවිතයෙන් යම් කාර්යයක් කරවා ගැනීම සඳහා පරිගණකයට ලබා දෙනු ලබන උපදෙස් මාලාවක් ..... ලෙස හඳුන්වයි.

පද ලැයිස්තුව : {මෘදුකාංග, ස්ථිරාංග, උපයෝගීතා වැඩසටහන්, දෘඩාංග, මෙහෙයුම් පද්ධතිය}

(ii) දත්ත සම්ප්‍රේෂණ විධි ආකාර දෙකක් නම් කර උදාහරණ එක බැගින් ලියා දක්වන්න.

(iii) පරිගණක ජාල භූගෝලීය පිහිටීම අනුව ප්‍රධාන ආකාර තුනකට වර්ගීකරණය කළ හැකිය. ඒ ආකාර තුන නම් කර එක් එක් ආකාරයට උදාහරණය බැගින් ලියා දක්වන්න.


(iv) ජාලකරණ උපාංග දෙකක් ලෙස ජාලකරණ ස්විචය සහ ජාලකරණ නාභිය අතර වෙනස්කම් දෙකක් ලියා දක්වන්න.

(v) පහත දක්වා ඇති වගුවේ X තීරුවේ A සිට D දක්වා වන අක්ෂර මගින් ආදාන උපාංග කිහිපයක් ද Y තීරුවේ 1 සිට 4 දක්වා ඒවායේ කාර්යයන් අනුපිළිවෙලට නොමැතිව ලබා දී ඇත.

X		Y	
A	චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය	**1**	සලකුණු හඳුනා ගැනීම සඳහා යොදා ගනියි
B	ප්‍රකාශ සලකුණු සංජානනය	**2**	බැංකුවල චෙක්පත්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට භාවිතා කරයි
C	ප්‍රකාශ අක්ෂර සංජානනය	**3**	ඡායාරූප සහ වීඩියෝ දර්ශන පරිගණකයට අදානය කිරීමට භාවිතා කරයි
D	සංඛ්‍යාංක කැමරාව	**4**	විශාල ලේඛන සුපිරීක්ෂණයට සහ එම ලේඛන සංස්කරණය කිරීමට භාවිතා කරයි

X සහ Y තීරු ගළපා ලේබලය - අංකය ආකාරයෙන් ලියා දක්වන්න.

3. (i) පහත දැක්වෙන තාර්කික පරිපථයට අදාළ සත්‍යතා වගුව ගොඩ නගන්න.



(ii) AND, OR සහ NOT ද්වාර පමණක් යොදා ගනිමින් A+B.$\overline{C}$ යන බූලීය ප්‍රකාශය සඳහා සත්‍යතා වගුව සහ පරිපථ සටහන ගොඩ නගන්න.

(iii) ලා නිල් වර්ණයෙහි RGB දශමය අගයන් පිළිවෙලින් 34, 116, 166 වේ. ඉහත වර්ණයෙහි ෂඩ්දශමය වර්ණ කේතය ගොඩ නගන්න.

(iv) පහත දැක්වෙන්නේ අමල්ගේ පරිගණකයේ ඇති ගොනු කිහිපයකි. මෙම ගොනු සියල්ල ම උපස්ථ කිරීමට අවශ්‍යව ඇත. නමුත් ඔහු සතුව ඇත්තේ 4GB සැනෙලි ධාවකයක් පමණි. සියලු ම ධාරිතාව පිරී යන පරිදි ගබඩා කළ හැකි ගොනු මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

ගොනුව	ධාරිතාව
School images	2.5 GB
Assignments	1536 MB
Presentations	1GB

4. (i) පහත a, b, c සහ d මගින් දී ඇති ප්‍රකාශවලට වඩාත් සුදුසු පදය වරහන් තුලින් තෝරා ලියන්න.

a - එක් අවස්ථාවක දී එක් පරිශීලකයෙක් සම්බන්ධයෙන් පහසුකම් සපයන මෙහෙයුම් පද්ධතියකි

b - එක් පරිශීලකයෙක් එක් අවස්ථාවක දී එකිනෙකට වෙනස් වූ කාර්යයන් කිහිපයක් කිරීම සම්බන්ධයෙන් පහසුකම් සපයන මෙහෙයුම් පද්ධතියකි

c - එක් අවස්ථාවක දී පරිශීලකයින් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් පහසුකම් සපයන මෙහෙයුම් පද්ධතියකි

d - ආදානය ලබාදුන් විගසින් කිසිදු ප්‍රමාදයකින් තොරව සේවාව සපයන මෙහෙයුම් පද්ධතියකි

පද ලැයිස්තුව: {MS DOS, Windows 7, Windows Server, Calculator OS}

(ii) පහත A හා B තීරු ගළපා නිවැරදි පිළිතුරු ලේබල මගින් පමණක් ලියා දක්වන්න.
(1⟶ P ලෙස ලියා දක්වන්න.)

A		B	
1	BIOS	P	මව් පුවරුවේ ROM චිපයක ගබඩා කොට ඇති මූලික මෘදුකාංගයකි
2	MBR	Q	පරිගණකය ආරම්භ කරන විට මූලික උපකරණ පරීක්ෂා කරන ස්වයං පරීක්ෂණ ක්‍රියාවලියකි
3	POST	R	පරිගණකයේ මූලික සැකසුම් පද්ධති සහ දිනය වේලාව වැනි තොරතුරු තාවකාලිකව ගබඩා කරන මතකයකි
4	CMOS	S	දෘඩ තැටියක පළමු අංශය (sector) තුළ ඇති පද්ධතිය ආරම්භ කිරීමට අවශ්‍ය තොරතුරු ගබඩා කළ කොටස

(iii) දෘඩ තැටියක කාර්යක්ෂමතාවය පහළ යාමට බලපාන බණ්ඩනය සිදු වීමට එක් හේතුවක් සඳහන් කරන්න.

(iv) පරිගණක මෙහෙයුම් පද්ධතියක් මගින් ඉටු කෙරෙන සේවා අතර දැක්වෙන මතක කළමනාකරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

5. පහත පෙන්වා ඇත්තේ computer school නැමති ආයතනයක සිසු / සිසුවියන් බඳවා ගැනීම් හා විවිධ පාඨමාලා සහ ඒවායේ නම් ලේඛනගත කිරීම් හා ආචනය කිරීමට භාවිතා කරන සම්බන්ධිත දත්ත සමුදාය වගු ය.

STUDENT TABLE

STUDENT_ ID	S_NAME	DOB	TP_ NUMBER
S001	MAHESH	2007/05/03	0711111111
S002	KALINDU	2007/06/20	0772222222
S003	SHIROMI	2007/2/12	0783333333
S004	THARUN	2008/01/20	0745555555

COURSE TABLE

COURSE_ID	COURSE-NAME	DURATION	COURSE_FEES
C001	ARTIFICIAL INTERLIGENT	1 YEAR	150000
C002	NETWORKING	6 MONTHS	60000
C003	WEB DEVELOPMENT	6 MONTHS	50000

REGISTRATION TABLE

STUDENT_ID	COURSE_ID	REGISTRATION_DATE	PAYMENT
S001	C002	2025/10/11	YES
S004	C002	2025/10/20	NO

(i) COURSE TABLE හි ක්ෂේත්‍ර ගණන සහ රෙකෝඩ ගණන ලියා දක්වන්න.

(ii) STUDENT TABLE වගුවේ ප්‍රාථමික යතුර ලියා දක්වන්න.

(iii) ආගන්තුක යතුරක් සඳහා උදාහරණයක් වගු නාමය සමග ලියා දක්වන්න.

(iv) පහත සඳහන් දෑ සපුරාලීම සඳහා කුමන වගුව / වගු යාවත්කාලීන කළ යුතු ද?

(a). INTRODUCTION OF ICT නැමති නව පාඨමාලාවක් ආයතනය විසින් ඇරඹීම.

(b). නව සිසුවෙක් ආයතනයේ ARTIFICIAL INTERLIGENT නැමති පාඨමාලාවට ලියාපදිංචි වීම.

(v) මාස 6ක කාල සීමාවක් යටතේ පැවැත්වෙන INTRODUCTION OF ICT නැමති පාඨමාලාව හැදෑරීම සඳහා පීරිස් (PERIS , S008) නැමති නව සිසුවෙක් ලියාපදිංචි වේ.

(a). ඉහත සිද්ධියට අදාළව යාවත්කාලීන කළ යුතු වගුව/වගු මොනවා ද?

(b). යාවත්කාලීන විය යුතු පේළිය/පේළි දී ඇති ආකාරයෙන් ලියා දක්වන්න.

(වගු නාමය - ක්ෂේත්‍රය 1, ක්ෂේත්‍රය 2, ක්ෂේත්‍රය 3)

6. පහත වැඩපත මගින් මෑතක දී ප්‍රදර්ශනය කරන ලද චිත්‍රපටයක එක් එක් චරිතය රඟ දැක්වීමේ දී භාවිතා කරන ලද ඇඳුම් කට්ටල ප්‍රමාණය සහ ඒවායේ මිල ගණන් දක්වා ඇත. එම පැතුරුම්පත් කොටස භාවිතා කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

	A	B	C	D	E
1		චරිතය	ඇඳුම් කට්ටල ප්‍රමාණය	ඒකක පිරිවැය	මුළු පිරිවැය
2	1	සේහස්ගේ මව	5	Rs.350.00	Rs.1,750.00
3	2	සේහස්ගේ පියා	6	Rs.700.00	Rs.4,200.00
4	3	සේහස්	8	Rs.800.00	Rs.6,400.00
5	4	අනුපම	7	Rs.750.00	Rs.5,250.00
6	5	අනුපමගේ නංගි	9	Rs.950.00	Rs.8,550.00
7					
8					
9		වැඩිම ඇඳුම් කට්ටල ප්‍රමාණය	9		
10		අඩුම ඒකක පිරිවැය		Rs.350.00	
11		මුළු පිරිවැය			Rs.26,150.00

(i) එක් එක් කට්ටලය සඳහා මුළු පිරිවැය E2 කෝෂයට ලබා ගැනීමට අදාළ සූත්‍රය ලියා දක්වන්න.
(මුළු පිරිවැය = ඇඳුම් කට්ටල ප්‍රමාණය * ඒකක පිරිවැය)

Past Papers Wiki


(ii) E2 කෝෂයට ඇතුළත් කරන ලද සූත්‍රය E2: E6 කෝෂ පරාසයට පිටපත් කළේ යැයි සිතන්න. එවිට E5 කෝෂයේ දිස්වන සූත්‍රය ලියා දක්වන්න.

(iii) C8 කෝෂයට භාවිතා කරන ලද වැඩිම කට්ටල ප්‍රමාණය ලබා ගැනීමට අදාළ සූත්‍රය =Function(Cell1:Cell2) ආකාරයෙන් ලියා දක්වන්න.

(iv) E10 කෝෂයට මුළු පිරිවැය වල එකතුව ලබා ගැනීමට අදාළ සූත්‍රය =Function(Cell1:Cell2) ආකාරයෙන් ලියා දක්වන්න.


(v) C7 කෝෂයට ඇඳුම් කට්ටල වර්ග ප්‍රමාණය ලබා ගැනීමට අදාල සූත්‍රය =Function(Cell1:Cell2) ආකාරයෙන් ලියා දක්වන්න.

7. පහත දක්වා ඇත්තේ වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් සකස් කළ ලේඛනයකි.



Past Papers Wiki


(i) ඉහත සකස් කර ඇති ලේඛනයේ ලේබල A සිට I දක්වා සකස් කර ගැනීමට භාවිත කළ හැකි මෙවලම් අංකය පහත දී ඇති මෙවලම් තීරුව ආධාරයෙන් ලියා දක්වන්න.(ලේබලය - අංකය ලෙස)



(ii) පහත දැක්වෙනුයේ වදන් සැකසුම් මෘදුකාංගවල දී භාවිත කළ හැකි මෙවලමකි. එහි භාවිතය කෙටියෙන් ලියන්න.



(iii) විද්‍යුත් සමර්පණ මෘදුකාංගවල භාවිත වන පහත දැක්වෙන මෙවලම් අතරින් A, B, C සහ E මෙවලම්වලට ගැළපෙන පදය වරහන් තුලින් තෝරා ලියන්න.



A B C D E

පද ලැයිස්තුව: {කියවුම් දසුන (Reading view), සාමාන්‍ය දසුන (Normal View), කදා සුබෙදුම් දසුන (Slide sorter View) , සමර්පණ රාමු දසුන (Slide Show View), දළ සටහන් දසුන (Outline View)}

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library